# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: DMS/IMU/002/ITMD

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2019.12. 02

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>මාර්ගගත කාර්යමණ්ඩල කළමනාකරණ පද්ධතිය සඳහා නව පරිශීලක ගිණුම් ඇති කිරීම</u>

උක්ත කාරණය සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සමාංක හා 2019.06.03 දිනැතිව ඔබ වෙත යොමු කරන ලද ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, රාජ්‍ය අංශයේ කාර්යමණ්ඩලය පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීමේ වගකීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති අතර, ඒ සම්බන්ධ කාර්යයන් වඩා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා මාර්ගගත පද්ධතියක් සකස් කර ඇත. එම පද්ධතියෙහි කටයුතු කිරීම සඳහා එක් එක් ආයතනයන්හි කාර්යමණ්ඩල විෂයභාර නිලධාරී සඳහා පරිශීලක ගිණුම් විවෘත කළ යුතුව ඇති අතර එම ලිපිය මඟින් කැඳවන ලද තොරතුරු ඔබ ආයතනය විසින් මේ දක්වා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය කරමි.

03. එබැවින්, ඔබ අමාත්‍යාංශ වෙතින් බලයලත් නිලධාරියෙක් හා විෂයභාර නිලධාරියෙක් ද, ඔබ අමාත්‍යාංශයට අයත් සියලුම දෙපාර්තමේන්තු හා ආයතන වෙතින් එක් විෂයභාර (කාර්යමණ්ඩල විෂයභාර) නිලධාරියෙක් බැගින් ද නම් කර මේ සමඟ ඇති ඇමුණුම සම්පූර්ණ කර **<u>2019 දෙසැම්බර් 15 දිනට ප්‍රථම</u>** infodms.it@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

04. ඉහත 03 ඡේදයේ සඳහන් නිලධාරීන් හට ඉදිරියේදී මෙම දත්ත පද්ධතිය සම්බන්ධයෙන් එක් එක් ආයතනයට අදාල සියලුම රාජකාරි කටයුතු කිරීමට සිදුවන හෙයින් ඉහත තොරතුරු ප්‍රමාදයකින් තොරව හැකි ඉක්මනින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සලස්වන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

05. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන කඩිනම් ප්‍රතිචාරය අගය කරමි.

වැඩිදුර උපදෙස් සඳහා :-
විමසීම

බී.එම්.ඩී.එන්. බාලසූරිය
අධ්‍යක්ෂ
011-2484682
Fax :- 011-2430270

මධුෂානි වර්ණසූරිය
සහකාර අධ්‍යක්ෂ
011-2151421
Fax :- 011-2484846

එස්.ආර්. ආටිගල
භාණ්ඩාගාර ලේකම්